# සෝමින්ද්‍රාභිනන්දන

පූජ්‍ය කටුවස්ගොඩ සෝමින්ද්‍රාභිධාන මහා ස්වාමීන්ද්‍රයන්වහන්සේ

## අභිනන්දන ශාස්ත්‍රීය සංහිතාව

සංස්කාරක

**පූජ්‍ය මොනරාගල නන්දසිරි හිමි**

**සෝමින්දාභිනන්දන**
පූජ්‍ය කටුවස්ගොඩ සෝමින්දාභිධාන මහා ස්වාමීන්ද්‍රයන්වහන්සේ
අභිනන්දන ශාස්ත්‍රීය සංහිතාව

**සංස්කාරක**
මොනරාගල නන්දසිරි හිමි
සහකාර අධ්‍යාපන අධ්‍යක්‍ෂ (පිරිවෙන්)

**ප්‍රථම මුද්‍රණය**
ව්‍යවහාර වර්ෂ 2021

ISBN 978-624-5643-00-4

**පිටු සැලසුම හා පිටකවරය**
ආර්. ඒ. නයනානන්ද
අංක 171/1, ලක්‍ෂමී පාර, ගම්පහ.
077 95 69 473

**මුද්‍රණය**
දිසානායක ප්‍රින්ටර්ස්
බැණ්ඩියමුල්ල, ගම්පහ.
071 367 5263

**අනුග්‍රහය**
ලකී ප්‍රනාන්දු මහතා ඇතුළු පවුලේ සැම,
මීගමුව.

**ප්‍රකාශනය**
ශ්‍රී සුධර්මානන්ද මූල මහා විහාරය
කොරසේ, උඩුගම්පොල.

17. බුදු දහමෙන් පිළිබිඹු වන අධ්‍යාපනික අරමුණු හා ඒවායේ වැදගත්කම පිළිබඳ අධ්‍යයනයක් 300
පූජ්‍ය මඩුගල්ලේ සුදත්ත හිමි,
Royal pundith (OSS), B.ED Hons, ( University Of Peradeniya).

18. පාලි විනය පිටකයේ සැකැස්ම 329
පූජ්‍ය පහලගම ධම්මික හිමි
ආධුනික කථිකාචාර්ය, ප්‍රායෝගික බෞද්ධ අධ්‍යයන අංශය,
ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර.

# පාලි විනය පිටකයේ සැකැස්ම

ආධුනික කථිකාචාර්ය
පූජ්‍ය පහලගම ධම්මික හිමි

## හැඳින්වීම

විනය යන්නෙහි වචනාර්ථය දෙස බැලූ විට පැහැදිළි වන්නේ, විනය යන්න අර්ථ කීපයක භාවිත වන බවයි. පාලි සංස්කෘත යන භාෂා දෙකේම විනය වශයෙන් ව්‍යවහාර වන අතර ඒ සඳහා සිංහල භාෂාවේ අර්ථකථන කීපයක් දැක්වේ. එහි ප්‍රධාන අර්ථකථනයක් වශයෙන් දැක්වෙන්නේ හික්මීම යන්නයි. වි + නි (නයෙ) ධාතුවෙන් විනයති යන්න සකස් වෙයි. පාලියෙහි විනය යන්න බෙහෙවින් යෙදෙන්නේ විනය පිටකය හැඳින්වීම සඳහා ය. 'උභතො විභංග ඛන්ධ පරිවාර'[1] යන්න විනය පිටකයයි. මෙහි හික්මීමේ මාර්ගය දැක්වෙන හෙයින් විනය පිටකය හැඳින්වීම සඳහා ආඥා දේශනා, යථාපරාධසාසන, සංවරාසංවරකථා යනුවෙන් ව්‍යාවහාර කරයි.[2]

චිල්ඩර්ස් විසින් සම්පාදිත ඉංග්‍රීසි පාලි කෝෂ ග්‍රන්ථයෙහි අර්ථ හයක් දක්වා තිබේ.

1. සඤ්ඤාපෙති - පිහිටුවයි
2. අක්කමති - කඩයි, පාගයි, යටපත් කරයි, ඉදිරියට යයි
3. අභිභවති - මඩියි, යටපත් කරයි, මිරිකයි.

4. පරිවත්තෙති - පෙරළයි
5. අනුසික්ඛති - හික්මෙයි
6. විනෙති - ඉවත් කරයි, දුරුකරයි.

වස්කඩුවෙ සිරි සුභූත හිමියන් අභිධානප්පදීපිකා සූචි නම් ග්‍රන්ථයේ දී විනය යන්න පිළිබඳව අර්ථ දක්වන්නේ මෙසේය.

නී (නීහරණං අපනයනං, ආහරණං ගහණං)

නීහරණං - දුරු කිරීම, බැහැර කිරීම, ගෙනයාම,
අපනයනං - අවනතවීම
ආහරණං - ගෙන ඒම, පැමිණීම
ගහණං - ගැනීම [3]

විනය යන්න මූලික වශයෙන් විවිධ අර්ථයන්හි භාවිත වන බව මෙයින් පෙනී යයි. බුද්ධ දේශනාව තුළ මූලික වශයෙන් විනය යනුවෙන් භාවිත වන්නේ හික්මීම සඳහාය. ශික්ෂා මාර්ගයක් ප්‍රකට කිරීම සඳහාය.

විනය යන්න පිළිබඳව අට්ඨකථා විවරණය දෙස බැලීම මෙහි දී ඉතා වැදගත් වෙයි. විනය පිටකය සඳහා බුද්ධඝෝස හිමියන් විසින් කළ අට්ඨකථාව 'සමන්තපාසාදිකා' නම් වෙයි. එහි දී,

"විවිධවිසෙස නයත්තා
විනයනතොචෙව කායවාචානං,
විනයත්තවිඤූහි අයං
විනයො විනයො'ති අක්ඛාතො" [4]

අයමෙත්ථ විවිධවිසෙසනයතා'ති ඉමිස්සා ගාථා අත්ථං විභාවෙන්තො විවිධා ඉති පදෙන දළ්හීකම්මසිථිලකරණප් පයොජනාති යථාක්කමං ලොකවජ්ජෙසු සික්ඛාපදෙසු

දළ්හීකම්මප්පයොජනා, පණ්ණත්තිවජ්ජෙසු සිථිලකරණප්පයොජනාති අත්ථමෙවං ඉති සංජානිතබ්බං මඤ්ඤෙ.

අයමෙත්ථ විසෙසනයං ඉති අපුබ්බපදවණ්ණා ච විනයවිච්ඡයං ඉමානි අත්ථානි පාකටී කරොති. "විනයනූපායන්ති විවිධාකාරෙන, විසෙසනයතො වා කායවාචානං නයනං දමනං අකත්තබ්බතො නිවත්තෙත්වා කත්තබ්බෙසු නියොජනං විනයනං, උපෙච්ච තං ඵලං ආයති උප්පජ්ජතීති උපායො, හෙතු, විනයනස්ස උපායො විනයනූපායො, තං, කායජීවිතානපෙක්ඛානං සික්ඛාකාමානං පෙසලානං භික්ඛූනං භික්ඛුනීනං කායවාචානං අනනුලොමිකවිප්ඵන්දිතාපනයනසඞ්ඛාතදමනස්ස කාරණභූතන්ති වුත්තං හොති." එවමෙව ඛො පන විනය ඉති සික්ඛං. භික්ඛුස්ස වා භික්ඛුනියා වා ආයති සංවරත්ථාය විනයං ඉති අධිප්පායත්ථං.

වෙනත් අට්ඨකථාවල විනය යන්න විවරණය වන ආකාරය මෙහි දී වැදගත් වෙයි. විශේෂවශයෙන් 'විසිට්ඨං වා නයතීති විනයො' (ඉතිවුත්තක අට්ඨකථා) විශේෂ වශයෙන් විශේෂාර්ථයට යෑම පැමිණවීම විනය යනුවෙන් හඳුන්වයි.

භික්ෂු භික්ෂුණී උභය සංඝයාගේ හික්මීම උදෙසා දේශනා කළ අණ දේශනාව විනය වශයෙන් හඳුන්වයි. මුල් බුදු විසිවස තුළ ශික්ෂා පැනවීමක් සිදු නොවූ අතර එකී ශික්ෂා පැනවීම සිදු වූයේ නැත. යම් කිසි භික්ෂුවක් "වජ්ජ" වැරැද්දකට සිත පත්වූයේ නම් ඕවාද ප්‍රාතිමෝක්ෂය සිහිපත් කිරීම සිදු කරගන්නා ලදී. නමුත් පසු කාලීනව විනය ශික්ෂා පැනවීමේ ආවශ්‍යතා සසුන තුළ ඇති වන්නට විය. විශේෂ වශයෙන් ජෛන සාසන ක්‍රියා කලාපය ඊට බෙහෙවින් හේතු වී ඇති බව පෙනෙයි. විටෙක සැරියුත් හිමියන් බුදුරදුන්ගෙන් විමසා සිටින්නේ කකුසඳ කෝනාගමණ හා කස්සප භාග්‍යවතුන් වහන්සේගේ සසුන බොහෝ කල් පැවැත්මට හේතු කවරේද යන්වෙනි. මේ

සසුනෙහි ආශ්‍රවයන් ඉපදීමට හේතු කාරණා සංඝයා තුළ විද්‍යමාන නොවේ ද ඒතාක් සසුන සුරක්ෂිත බවත් යම් හෙයකින් ආශ්‍රවයන් ඇති කරන ධර්මතා පහළ වෙද්ද එකල විනය දේශනා කිරීමට සිදු වන බව තථාගතයන් වහන්සේ පැහැදිළි කළහ. '' ආගමෙහි ත්වං සාරිපුත්ත. ආගමෙහි ත්වං සාරිපුත්ත. තථාගතො'ව කාලං ජානිස්සති. න තාව සාරිපුත්ත සත්ථා සාවකානං සික්ඛාපදං පඤ්ඤාපෙති. න උද්දිස්සති පාතිමොක්ඛං යාව ඉධෙකච්චෙ ආසවට්ඨානියා ධම්මා සංඝෙ පාතුභවන්ති. අථ සත්ථා සාවකානං සික්ඛාපදං පඤ්ඤාපෙති. උද්දිස්සති පාතිමොක්ඛං. තෙසඤ්ඤෙව ආසවට්ඨානියානං ධම්මානං පටිඝාතාය.''[5] මෙම සාසනික නිර්මල භාවය පවත්වාගෙන යාමට නොහැකි වූයෙන් සසුන තුළ ආවට්ඨානීය ධර්මයෝ ප්‍රභවය වන්නට විය.[6]

01. රත්තඤ්ඤු මහත්තං පත්තො හොති.

02. වෙපුල්ලමහත්තං පත්තො හොති.

03. ලාභග්ගමහත්තං පත්තො හොති.

04. බාහුසච්චමහත්තං පත්තො හොති.

සුදින්න හාමුදුරුවන් මූලික කොට ගෙන ශික්ෂා සමුදායක් ථෙරවාද විනය තුළ දේශනා කොට තිබේ. එකී දේශනා භික්ෂු විනය හා භික්ෂුණී විනය වශයෙන් කොටස් දෙකකින් යුක්තය. භික්ෂු විනය සඳහා ශික්ෂා 227 ක් භික්ෂුණීන් සඳහා ශික්ෂා 311 ද අන්තර්ගත වෙයි. මෙම සියලු දේශනා ප්‍රථම සංගායනාවෙන් පසුව විනය පිටකය වශයෙන් සංග්‍රහ වී තිබේ. එකී විනය දේශනාවෙන් බුදුරදුන්ගේ බලාපොරොත්තුව වූයේ නිවන කරා මෙහෙයවීමයි. විනය දේශනාවේ අරමුණ මෙසේ පැහැදිලි කර ගත හැකිය.

01. සංඝයාගේ යහපත් පැවැත්ම සඳහා

02. සංඝයාගේ පහසු පැවැත්ම සඳහා
03. නොහික්මුණු පුද්ගලයන් හික්මවීම සඳහා
04. ශික්ෂාකාමීන්ගේ පහසු විහරණය සඳහා
05. මෙලොව ඇති වන ආශ්‍රවයන් දුරුකිරීම සඳහා
06. පරලොව වශයෙන් ඇති වන ආශ්‍රව දුරු කිරීම සඳහා
07. නොපැහැදුනවුන්ගේ පැහැදීම සඳහා
08. පැහැදුනවුන්ගේ පැහැදීම වඩා වර්ධනය වීම සඳහා
09. සද්ධර්මයේ පැවැත්ම සඳහා
10. විනයට අනුග්‍රහ සඳහා[7]

හික්මීම නිවන සඳහා අවශ්‍ය වෙයි. හික්මීම නම් ශික්ෂණයයි. ශික්ෂණය ඇති වන්නේ කායික හා වාචසික සංවරයෙනි. එය සීලය වශයෙන් හඳුන්වයි. සීලය හා විනය යනු ඉතා සියුම් සම්බන්ධතාවක් ඇති සංකල්ප දෙකකි. හුදෙක් විනය අවශ්‍ය වන්නේ නිවනට අනුග්‍රහ පිණිසය. ''කථඤ්ච භික්ඛවේ අනුපුබ්බසික්ඛා...අඤ්ඤාරාධනා හොම්...සද්ධාජාතො උපසංකමති...කායෙනචෙව පරමසච්චං කරොති''[8]

විනය විනය සඳහා නොව විනය නිවන සඳහා බව මෙයින් අවධාරිතයි.

භික්ෂු භික්ෂුණී උභය සංඝයාගේ ශීල පාරිශුද්ධත්වය සඳහා විනය දේශනා කොට තිබේ. උභය සංඝයාගේ ආයතී සංවරය ඇති වන්නේ විනය නයෙහි ක්‍රියාත්මකවීම තුළිනි. විනය ශික්ෂා අන්තර්ගත ග්‍රන්ථ සමුදාය විනය පිටකය නමින් හඳුන්වයි. පළමු සංගායනාව සඳහා සහභාගිවූවෝ ''විනයො නාම සාසනස්ස ආයූ''[9] වශයෙන් ශාසයෙහි ආයුෂ වශයෙන් විනය සැලකූහ. විනය තුළින් පුද්ගලාන්තර්ගත වැරදි නිවැරදි බවට පත් කර ගැනීමට අවශ්‍ය උපදෙස් ලබා දෙනු ලබයි. ඒ නිසා භික්ෂු දිවියෙහි වඩාත් වැදගත් ස්ථානයක් විනයට ලබා දී

තිබේ. ථෙරවාදී විනය පිටකය වශයෙන් සළකනු ලබන්නේ ග්‍රන්ථ පහකි. එකී ග්‍රන්ථ පහ නම්,

01. පාරාජිකපාළි
02. පාචිත්තිපාළි
03. මහාවග්ගපාළි
04. චුල්ලවග්ගපාළි
05. පරිවාරපාළි

විනය දේශනාව සිදු කොට ඇත්තේ බුද්ධ කාලීන භික්ෂු භික්ෂුණීන්ගේ ක්‍රියාකාරකම් මත පදනම් වී බව විනය පිටකය අධ්‍යයනය තුළින් පැහැදිලි වෙයි. කිසියම් ආකාරයක භික්ෂු දිවියට නොගැලපෙන යම් දෙයක් සිදු කළේ නම් ඒ සඳහා විනය ශික්ෂා දේශනා කොට තිබේ. එකී ප්‍රඥප්තිය සංවර්ධනය කිරීම ද විනය ශික්ෂා පැනවීම තුළ දක්නට ඇති විශේෂත්වය වෙයි.

## පාරාජිකපාළි

විනය පිටකයෙහි පළමු විනය ග්‍රන්ථය වෙයි. ප්‍රථමයෙන් පාරාජිකාපත්ති දක්වන බැවින් මෙම කෘතිය පාරාජිකපාළි යනුවෙන් නම් කරන්නට ඇතැයි අනුමාන කළ හැකිය. භික්ෂු සංඝයා විෂයෙහි පනවන ලද ශික්ෂා පද 227 න් ශික්ෂා පද 49 ක් අන්තර්ගත වෙයි. මෙම ශික්ෂා පද පාරාජිකපාළියෙහි කාණ්ඩ හතරක් තුළ සංග්‍රහ කොට තිබේ.

i. වෙරඤ්ජකණ්ඩ
ii. පාරාජිකකණ්ඩ
iii. සංඝාදිසෙසකණ්ඩ
iv. අනියතකණ්ඩ
v. පාචිත්තිකණ්ඩ

පාරාජිකා ශික්‍ෂා පද හතර, සංඝදිසේස දහ තුන, අනියත දෙක, පාචිත්තිය තිහ වශයෙන් පාරාජිකපාළියෙහි ශික්‍ෂා අන්තර්ගත වෙයි. භික්‍ෂු විනයෙහි වැදගත් වන ශික්‍ෂා වර්ග හතරක් පමණක් මෙම ග්‍රන්ථය තුළ දක්නට ලැබේ. එම ශික්‍ෂා පද නිදාන පුද්ගල වස්තු පදභාජනීය විනීත වස්තු සහිතව දක්වා තිබේ. මෙයින් ශික්‍ෂා පද බුද්ධභාෂිත වෙයි. නිදාන ගාථා ආදිය උපාලි මහරහතන් වහන්සේ ඇතුළු මහරහතන් වහන්සේලා විසින් සංග්‍රහ කොට තිබේ.

පාරාජිකපාළියෙහි පළමු කාණ්ඩය වෙරඤ්ජක කාණ්ඩයයි. එය ආරම්භ කරන්නේ නිදානය දක්වමින්ය. බුදුරදුන් වේරඤ්ජාවෙහි නළේරු කොහොඹ ගස මුල පන්සියක් මහාසංඝයා පිරිවාරා වැඩහිඳින අවස්ථාවේ දී වේරඤ්ජක බමුණා බුදුරදුන් හමුවීමට ඇවිත් සටුතු සාමීචි කථා ආදියෙහි යෙදෙයි. ඉන් අනතුරුව කථා ආදිය ද වේරඤ්ජක බමුණාට ඇසීමට තිබූ ප්‍රශ්න නිරාකරණය කොට ගෙන බුදුරදුන් අභිමුවෙහි දී සරණාගමයෙහි පිහිටීම පිළිබඳ පුවත් අන්තර්ගත වෙයි. "එවමෙවං හොතා ගොතමෙන අනෙකපරියායෙන ධම්මො පකාසිතො. එසාහං භවන්තං ගොතමං සරණං ගච්ඡාමි, ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. උපාසකං මං භවං ගොතමො ධාරෙතු, අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතං. අධිවාසෙතු ච මෙ භවං ගොතමො වෙරඤ්ජායං වස්සාවාසං සද්ධිං භික්ඛුසඞ්ඝෙනාති. අධිවාසෙසි භගවා තුණ්හීභාවෙන. අථ ඛො වෙරඤ්ජො බ්‍රාහ්මණො භගවතො අධිවාසනං විදිත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි."[10] වේරඤ්ජක බමුණා බුදුරදුන්ට වේරඤ්ජාවෙහි වස් විසීමට ආරාධනා කොට පිටත් වී යයි. මේ ආදී කථා පුවත් කීපයක් ම වේරඤ්ජක කාණ්ඩයේ ඇතුළත් වෙයි. ඉන් අනතුරුව අතීත බුදුවරුන්ගේ ගුණ පිළිබඳ තොරතුරු ඇතුළත් වී තිබේ. එම

බුදුවරුන්ගේ සසුන බොහෝ කල් පැවතීමට හේතු දක්වා තිබේ. එහි දී සැරියුත් හිමියන් බුදුරදුන්ට විනය දේශනා කරන ලෙස සිදු කළ ඉල්ලීම දක්නට ලැබේ.[11] එහි දී බුදුරදුන් ශික්ෂා පැනවීමට සඳහා වූ සුදුසු කාලය තමන් වහන්සේ දන්නා බව දක්වා ශ්‍රාවකයා තුළ ආසවට්ඨානීය ධර්මයෝ පහළ වූ කල ශික්ෂා පැනවීම සිදු කරන බව දේශනා කළහ. ධ්‍යාන පිළිබඳ හා ත්‍රිවිද්‍යා පිළිබඳ තොරතුරු ද දැක්වේ. වේරඤ්ජක බමුණාට වස්සාවාසයෙන් අනතුරුව බුදුරදුන් ජනපද චාරිකාවෙහි ගමන් කරන බව ප්‍රකාශ කරයි. එහි දී වේරඤ්ජක බමුණා ප්‍රකාශ කරන්නේ ගෘහාවාසයෙහි ඇති කාර්ය බහුලත්වය නිසා වත් පිළිවෙත් සිදු කිරීම අත පසු වූ බවය.[12] මෙහි දී බුදුරදුන්ට පසු දා දානය සඳහා බමුණා ආරාධනා කරයි. එහි දී බුදුරදුන් දන් වළඳා ධර්ම දේශනය කොට ජන පද චාරිකාවෙහි ගමන් කරයි. මේ දක්වා ම වේරඤ්ජක කාණ්ඩය වශයෙන් හඳුන්වා තිබේ.

පාරාජික කණ්ඩයෙහි සතර පාරාජිකා පිළිබඳ විස්තර හා පාරාජිකා ආපත්ති අන්තර්ගත වෙයි. පළමු මෛථුන ධර්ම පාරාජිකා ආපත්තිය දැක්වීමට පෙර නිදානය වශයෙන් සුදින්න භික්ෂුවගේ පැවිද්ද හා සම්බන්ධ තොරතුරු අන්තර්ගත වෙයි. සුදින්නගේ දෙමාපියන් පැවිද්දට අකමැති වූ විට සහායකයන්ගේ මැදිහත් වීම තුළින් පැවිද්දට පත්වීම පිළිබඳ දීර්ඝ විස්තරයක් දැක්වෙයි. පැවිදි වූ සුදින්න හිමියන්ගේ දෙමාපියන් විසින් තම පරපුර රැක ගැනීමට දාරකබීජයක් ඉල්ලා සිටීම හා සුදින්න හිමියන් තම පුරාණ දුතිකාව සමග මෛථුන සේවනයෙහි යෙදීම ආදී පුවත් හමුවෙයි. එම ක්‍රියාව භික්ෂූන් මාර්ගයෙන් බුදුරදුන්ට ආරංචිවීම හා ඊට පළමු මෛථුන ධර්ම පාරාජිකාව පැනවීම සිදු කරයි. බුදු රදුන්ගේ ප්‍රථම ප්‍රඥප්තිය වූයේ "**යො පන භික්ඛු මෙථුනං ධම්මං පටිසෙවෙය්‍ය, පාරාජිකො හොති අසංවාසොති.**"[13] පාරාජිකපාළියේ සුදින්න බණවර අවසන් වෙයි.

ඉන් පසුව දැක්වෙන්නේ මක්කටී වස්තුවයි. විශාලා නුවර කිසියම් භික්ෂුවක් විසින් වැඳිරියෙකු සමග මෛථුන ධර්මයෙහි යෙදීම හේතු කොට ගෙන අනු ප්‍රඥප්තිය දේශනා කොට තිබේ. **"යො පන භික්ඛු මෙථුනං ධම්මං පටිසෙවෙය්‍ය අන්තමසො තිරච්ඡානගතායපි, පාරාජිකො හොති අසංවාසොති."**[14] ඉන් පසු විශාලා නුවර වජ්ජිපුත්ත භික්ෂූන් වහන්සේගේ ක්‍රියා පටිපාටිය හේතු කොට ගෙන තෙවන ප්‍රඥප්තිය දේශනා කළහ. **"යො පන භික්ඛු භික්ඛූනං සික්ඛාසාජීවසමාපන්නො සික්ඛං අපච්චක්ඛාය දුබ්බල්‍යං අනාවිකත්වා මෙථුනං ධම්මං පටිසෙවෙය්‍ය අන්තමසො තිරච්ඡානගතායපි, පාරාජිකො හොති අසංවාසොති.'**[15]

තෙවැනි ප්‍රඥප්තියෙන් පසු පාරාජිකපාළියේ දැක්වෙන්නේ පද භාජනීය නම් කොටසයි. එහි දී පද සඳහා අර්ථ විවරණ දක්වා තිබේ. භික්ඛු යන්න සඳහා නිර්වචන රාශියක් දැක්වේ.[16] සික්ඛා තුන් ආකාරයට දැක්වෙයි. අධිසීල, අධිචිත්ත හා අධිපඤ්ඤා වශයෙනි.[17] ඉන් පසු විනීත වස්තුව වශයෙන් පාරාජිකාපත්තිය භික්ෂුවක් පත්විය හැකි අවස්ථා පිළිබඳ දක්වයි. දෙවැනි අදින්නාදාන පාරාජිකාව, තෙවැනි උත්තරිමනුස්සධමම් පාරාජිකාව, හා සිවු වැනි මනුස්සවිග්ගහ පාරාජිකාව පිළිබඳ තොරතුරු අන්තර්ගත වෙයි.

සංඝාදිසෙස කාණ්ඩයෙහි අන්තර්ගත වන්නේ සංඝාදිසේස 13 හා එහි නිදාන පුග්ගල වස්තු ආදියයි. සෑම සංඝාදිසේසයක් සඳහා ම පද භාජනීය දක්වා තිබේ. පඤ්ඤත්තිය හා අනුපඤ්ඤත්තිය සමහර සංඝාදිසේස සඳහා දැක්වේ. සංඝාදිසේස දහ තුන නම් වශයෙන් මෙසේය.

i. සුක්කවිස්සට්ඨිසික්ඛාපද

ii. කායසංසග්ගසික්ඛාපදං

iii. දුට්ඨුල්ලවාචාසික්ඛාපදං
iv. අත්තකාමපාරිචරියසික්ඛාපදං
v. සඤ්චරිත්තසික්ඛාපදං
vi. කුටිකාරසික්ඛාපදං
vii. විහාරකාරසික්ඛාපදං
viii. දුට්ඨදොසසික්ඛාපදං
ix. දුතියදුට්ඨදොසසික්ඛාපදං
x. සඞ්ඝභෙදසික්ඛාපදං
xi. භෙදානුවත්තකසික්ඛාපදං
xii. දුබ්බචසික්ඛාපදං
xiii. කුලදූසකසික්ඛාපදං

වශයෙන් එකී සංඝාදිසේස ආපත්ති පිළිබඳ විස්තර අන්තර්ගත වෙයි.

පාරාජිකපාළියෙහි ඉන්පසුව දක්වන්නේ අනියත කාණ්ඩයයි. එහි දී අනියත ශික්‍ෂා පද දෙකක් පනවා තිබේ. එකී අනියත ශික්‍ෂා පඨම අනියත ශික්‍ෂා පදය හා දුතිය අනියත ශික්‍ෂා පදය වශයෙන් පමණක් නම් කොට තිබේ. ශික්‍ෂා දෙකම සඳහා වස්තු වශයෙන් උදායි වස්තුව දැක්වෙන අතර පඤ්ඤත්ති හා පදභාජනීය වශයෙන් විස්තර වේ.

පාරාජිකපාළියේ අවසන් කාණ්ඩය වන්නේ නිස්සග්ගිය කාණ්ඩයයි. එහි දී නිස්සගිය් ශික්‍ෂා පද වග්ග යටතේ සංග්‍රහ කොට තිබේ. නිස්සග්ගිය ශික්‍ෂා 30 කි. එක වග්ගයකට ශික්‍ෂා පද 10 බැගින් වර්ගීකරණය කොට තිබේ. ඒ අනුව,

චීවර වග්ගය
කෝසිය වග්ගය
පත්ත වග්ගය

පාරාජිකපාලියේ දී දක්නට ලැබෙන්නේ අනියත ශික්ෂා දක්වා පමණි. භික්ෂු විනයට අදාළ ශික්ෂා පද හා ඊට අදාළ තොරතුරු මෙහි සංග්‍රහ කොට තිබේ.

## පාචිත්තියපාළි

විනය පිටකාගත කෘති අතරින් දෙවැනි කෘතිය වන්නේ පාචිත්තියපාළිය යි. මෙම කෘතිය පාචිත්ති ශික්ෂා පදවලින් ආරම්භ කරන හෙයින් පාචිත්තියපාළි යනුවෙන් නම් කර තිබේ. මෙම කෘතිය පාරාජිකපාළි කෘතියේ අන්තර්ගත භික්ෂු සංඝයා උදෙසා වූ ශික්ෂා පද සම්පූර්ණ වන්නේ පාචිත්තියපාළිය තුළිනි. මෙම කෘතිය කොටස් දෙකකට බෙදා ශික්ෂා සංග්‍රහ කොට තිබේ.

01. භික්ෂු විභංගය
02. භික්ෂුණී විභංගය

පළමුවෙන් භික්ෂු විභංගය තුළ ශික්ෂා සංග්‍රහ කොට තිබේ. ඒ ශික්ෂා පද සියල්ල භික්ෂූන් උදෙසා බලපැවැත්වේ. පාරාජිකපාළියෙහි ශික්ෂා පද 49ක් සංග්‍රහ කොට තිබෙන බැවින් මෙහි සංගහ වන්නේ ශික්ෂා පද 178කි. ඒ ශික්ෂා පද වර්ගීකරණය කළ ආකාරය වන්නේ,

- පාචිත්තිය
- පාටිදේසනීය
- සේඛියා
- අධිකරණ සමථ

- **පාචිත්තිය ශික්ෂා පද**

භික්ෂු සංඝයා උදෙසා පන වන ලද ශික්ෂා පද අතුරින් වැඩිම ශික්ෂා පද ප්‍රමාණයක් දක්නට ලැබෙන් පාචිත්තිය ශික්ෂා පදයනන්ය. එහි ශික්ෂා පද සංඛ්‍යාව 92කි. ''ඉමෙ ඛො පනායස්මන්තො ද්වෙ නවුතියා පාචිත්තියා ධම්මා උද්දෙසං ආගච්ඡන්ති'' (පාචිත්තියපාළි 02 පිටුව) පාචිත්තිය ශික්ෂා පද වග්ග 09 තුළ සංග්‍රහ කොට තිබේ.

i. මුසාවාදවග්ගය
ii. භූතගාමවග්ගය
iii. භික්ඛුනොවාදවග්ගය
iv. භොජනවග්ගය
v. අචේලකවග්ගය
vi. සුරාපානවග්ගය
vii. සප්පාණකවග්ගය
viii. සහධම්මිකවග්ගය
ix. රාජවග්ගය

වශයෙන් වග්ගවලට බෙදා වෙන් කොට තිබේ.

වග්ගයක ශික්ෂා පද දහය බැගිනි. අට වැනි වග්ගය වූ සහධම්මික වග්ගයෙහි පමණක් ශික්ෂා පද දොළහක් සංග්‍රහ කොට තිබේ. ''සම්පජානමුසාවාදෙ පාචිත්තියං''[18] යනුවෙන් පළමු පචිති ශික්ෂා පදයෙන් එකී ශික්ෂා ආරම්භ වෙයි.

- **පාටිදේසනීය ශික්ෂා පද**

පාචිත්තිය අනූදෙකින් පසුව භික්ෂු විනය උදෙසා සංග්‍රහ කොට ඇත්තේ පාටිදේසනීය ශික්ෂා පදයි. පාටිදේසනීය ශික්ෂා පද ගණන හතරකි. ''ඉමෙ ඛො පනායස්මන්තො චත්තාරො පාටිදෙසනීයා ධම්මා උද්දෙසං ආගච්ඡන්ති''[19] පාටිදේසනීය යනු වහා ඇවත දේසනා කළ යුතු යන්නයි. පාටිදේසනීය ශික්ෂා

ආහාර පිළිගැනීම් පිළිබඳ අවස්ථා හතරක් අවරණය වන සේ පනවා තිබේ. පාටිදේසනී ශික්‍ෂා විශේෂ නාමයකින් හඳුන්වා නැත. පළමු, දෙවන ආදී වශයෙන් පාටිදේසනීය නම් කර ඇත.

- සෙඛියා ශික්‍ෂා පද

සේඛියා ශික්‍ෂා පද 75කි. සේඛියා ප්‍රමාණය වග්ග හෙවත් කොටස් කිහිපයකට බෙදා දක්වා ඇත. පරිමණ්ඩල වග්ගය - ශික්ෂා පද 10, උජ්ඣග්ගික වග්ගය - ශික්ෂා පද 10, ඛම්භකත වග්ගය - ශික්ෂා පද 10, සක්කච්ච වග්ගය - ශික්ෂා පද 10, කබල වග්ගය - ශික්ෂා පද 10, සුරු සුරු වග්ගය - ශික්ෂා පද 10 හා පාදුකා වග්ගය - ශික්ෂා පද 15 වශයෙනි. මෙහිදී පරිමණ්ඩල වග්ගය වෙන් කොට ඇත්තේ භික්ෂූන් වහන්සේගේ සිවුරු හැදීම් පෙරවීම් සම්බන්ධ කරුණු කෙරෙහි ය. මඟතොට හැසිරීම, ගමෙහි හැසිරීම, දන් පිළිගැනීම, දන් වැළඳීම මැනැවින් සංවරශීලීව සිදු කළ යුතු ආහාර පාන පරිභෝජනය, දහම් දෙසීමේ දී අනුගමනය කළ යුතු පටිපාටිය, මළ මුත්‍රා කිරීම් ආදියේ දී පිළිපැදිය යුතු ශික්ෂා සුරු සුරු හා පාදුකා වග්ගවල දක්වා ඇත. "පරිමණ්ඩලං නිවාසෙස්සාමීති සික්ඛා කරණීයා" (හාත්පසින් වටකොට මනාලෙස අඳනය අඳිමියි හික්මිය යුතුය). "පරිමණ්ඩලං පාරුපිස්සාමීති සික්ඛා කරණීයා" (හාත්පසින් වටකොට මනා ලෙස සිවුර පොරවමියි හික්මිය යුතුය.) "සුපටිච්ඡන්නෝ අන්තරඝරේ ගමිස්සාමීති සික්ඛා කරණීයා" (මනාකොට අඳනය සිවුර හැඳ පොරවා ඇතුළු ගමෙහි ඇවිදිමියි හික්මිය යුතුය.) භික්ෂූන් වහන්සේ අඳනය, සිවුර ඇඳිය පැළඳිය යුත්තේ කෙසේද යන්න මෙම ශික්ෂා පද පැහැදිලි කරයි. මැනැවින් සිවුරු පෙරෙව් භික්ෂූන් වහන්සේ දකින තැනැත්තන් තුළ ශ්‍රද්ධාව ජනිත වේ. මේ ආදී වශයෙන් සේඛියා ශික්‍ෂා වර්ග කොට සංග්‍රහ වී ඇත.

- **අධිකරණ සමථ**

හික්ෂු සමාජයේ උද්ගත වූ කිසියම් ආකාරයක අධිකරණයක් සංසිඳුවා ගන්නා ආකාර හතක් පිළිබඳ සත්ත අධිකරණ සමථ තුළින් දක්වා තිබේ. ගැටළුවක් විනිශ්චයට පත් කරන ආකාරය මෙමගින් නිර්දේශිතයි. භික්ෂු අධිකරණය සර්ව සාධාරණ ආකාරයෙන් සිදු කළ යුතුයි. අධිකරණ කාරක භික්ෂුව ආපත්තියකට පත් නොවන්න කටයුතු කිරීම මෙහි ඇති සුවිශේෂත්වය වෙයි. අධිකරණ හත මෙසේය,

i. සම්මුඛ විනය
ii. සති විනය
iii. අමුල්හ විනය
iv. පටිඤ්ඤාහ විනය
v. යෙභයා සිකවිනය
vi. තස්සපාපීය සිකවිනය
vii. තිණවත්ථාරක විනය

විවාදාධිකරණයේ නඩුවක් විසඳිය යුතු ක්‍රමය වශයෙන් සම්මුඛා විනය යෙභුයාසිකා විනය දක්වා තිබේ. අනුවාධිකරණ නඩුවක් විසඳිය යුතු ක්‍රම වශයෙන්, සම්මුඛා විනය, සති විනය, අමුල්හ විනය, තස්සපාපීයසිකා විනය දක්වා තිබේ. ආපත්තාධිකරණ නඩුවක් විසඳන ක්‍රමය වශයෙන් පටිඤ්ඤාහකරණ විනය, තිණවත්ථාරක විනය දක්වා තිබේ. කිච්චාධිකරණ නඩුවක් විසඳන ක්‍රමය වශයෙන් සම්මුඛා විනය දක්වා තිබේ. මේ ආකාරයෙන් නඩු වර්ග 4 විසඳන ක්‍රම 07 ක් ඇත.

පාචිත්තියපාළියේ භික්ෂු විභංගය තුළ ශික්ෂා පද 178ක් අන්තර්ගත වෙයි. එම ශික්ෂා පිළිබඳ නිදාන වස්තු පුද්ගල ආදියත් සවිස්තරාත්ම ස්වරූපයකින් පාචිත්තියපාළියේ

අන්තර්ගත වෙයි. ඉන් පසු පාචිත්තිපාළියේ දෙවැනි කොටසේ ශික්ෂා පද වර්ගීකරණය සිදු කොට තිබේ. ඒ භික්ෂුණී විභංගය තුළිනි. එහි අන්තර්ගත වන්නේ භික්ෂුණීන් වහන්සේ උදෙසා වූ ශික්ෂා පද සමුදායයි.

භික්ෂුණී විභංගය තුළ සංග්‍රහ කොට ඇති ශික්ෂා භික්ෂුණී සංඝයාගේ ශීල පාරිශුද්ධත්වය සඳහා බලපානු ලබයි. අනියත හැර අනෙක් ආපත්ති භික්ෂුණීන් උදෙසා පනවා තිබේ. සියලු ශික්ෂා පද සංඛ්‍යාව 304 කි.

## මහාවග්ගපාළි

විනය පිටකයෙහි තුන්වන කෘතිය වන්නේ මහාවග්ගපාළියයි. මහාඛන්ධකය ග්‍රන්ථ සැකැස්ම සිදු කොට ඇත්තේ 'ඛන්ධක' යන නාමයෙනි. ඛන්ධක යනුවෙන් නම් කළ පරිච්ඡේදයන් තුළි විනය කර්ම කළ යුතු ආකාරය ආදී තොරතුරු ඇතුළත් වෙයි. මහාවග්ගපාළියෙහි ඛන්ධක 10කි.

එකී ඛන්ධක,

i. මහාඛන්ධක
ii. උපොසථඛන්ධක
iii. වස්සූපනායිකඛන්ධක
iv. පවාරණඛන්ධක
v. චම්මඛන්ධක
vi. භෙසජ්ජඛන්ධක
vii. කඨිනඛන්ධක
viii. චීවරඛන්ධක
ix. චම්පෙය්‍යඛන්ධක
x. කොසම්බඛන්ධක

වශයෙන් වර්ගීකරණය සිදු කොට තිබේ. මහාඛන්ධකයෙන් මෙම ග්‍රන්ථය ආරම්භ වන හෙයින් මහාවග්ගපාළි නමින් නම් කොට තිබෙන බව පෙනෙයි.

i. **මහාඛන්ධක**

මහාඛන්ධකයෙහි බුද්ධචරිතය, තපස්සු භල්ලුක වෙළඳ පුවත්, උපක ආජීවක හමුව, පස්වග භික්ෂූන්ට දම්සක් පැවැත්වීම, යස පැවිද්ද, භද්දවග්ගිය කුමාර පුවත්, තුන් බෑ ජටිලයන් එහි භික්ෂු භාවයෙන් පැවිදි කිරීම, බිම්බිසාර රජු හමුව, අගසවුසන්ගේ පැවිද්ද උපාධ්‍යායා සද්ධිවිහාරික ආචාර්ය අන්තේවාසි වත් ආදිය මෙහි අන්තර්ගත වෙයි.

ii. **උපොසථඛන්ධක**

පාමොක් උදෙසීම පණ්ණරසී හා චාතුද්දසී උපෝසථ කර්ම කළ යුතු ආකාරය. උපෝසථාගාර සම්මුති, උපෝසථාගාර සමූහනය, පුබ්බකරණ, ඡන්දය ගැනීම, වජ්ජනීය පුද්ගල පුවත් ආදීය උපෝසථ කර්මය හා සම්බන්ධ විධි හා ඊට අදාළ තොරතුරු මෙම ඛන්ධයෙහි අන්තර්ගත වෙයි.

iii. **වස්සූපනායිකඛන්ධක**

භික්ෂූන් වහන්සේ වැසි හාර මාසයේ දී වස්වාසය සිදු කළ යුතු ආකාරය පිළිබඳව තොරතුරු ඇතුළත් වෙයි. පෙර වස් විසීම හා පසුවස් විසීම පිලිබඳ, සත්තාහකරණය, ආදිය දැක්වේ.

iv. **පවාරණඛන්ධක**

වස් විසීමෙන් පසු සිදු කරනු ලබන පවාරණය පිළිබඳ තොරතුරු ඇතුළත් වෙයි. සංඝපවාරණ ක්‍රම මෙහි දක්වා තිබේ.

v. **චම්මඛන්ධක**

සෝණකොළිවීස වස්තුව පළමු කොට දැක්වේ. සොණ හිමියන්ට පාවහන් පැලදීම සඳහා ලබා දුන් අවසරය, භික්ෂුවට සුදුසු හා නුසුදුසු පාවහන් පිළිබඳ තොරතුරු, ආසන පරිහරණය පිළිබඳ පුවත් ද මෙහි ඇතුළත් වෙයි.

### vi. භෙසජ්ජඛන්ධක

භික්ෂුවගේ රෝග නිවාරණයට අදාළ වූ බෙහෙත් පිළිබඳ තොරතුරු අන්තර්ගත වෙයි. පිළින්දවච්ඡ හිමියන්ගේ පුවත්, භික්ෂුව විසින් පිළිනොගත යුතු මස් මාංශ පිළිබඳ විස්තරය, පාටලීගාම වත්ථු, සුනීධවස්සකාර වත්ථු, අම්බපාලි, ලිච්ඡවී, කේනිය ජටිල, සීහසේනාධිපති, මෙණ්ඩක ගහපති, රෝජමල්ලව වත්ථු, චතුමහාපදේස ආදය පිළිබඳ තොරතුරු දැක්වේ.

### vii. කඨිනඛන්ධක

කඨිනය ඇතිරීම පිළිබඳ තොරතුරු ඇතුළත් වෙයි. කඨිනය ඇතිරූ භික්ෂුවට අනාමන්තචාරය (නො විචාර ගම් වැදීම) අසමාදානාචාරය (තුන් සිවුර රැගෙන යාම) ගණ භෝජනය (සමූහ භෝජනය) යාවදත්ථ චීවරය (කැමති පමණ සිවුරු පිළිගැනීම) චීවරුප්පාදය (කඨිනය ලැබූ භික්ෂුවට එම වෙහෙරෙහි චීවරාදියෙහි භාරකාරිත්වය හිමි වීම) ආදී තොරතුරු ඇතුලත් වෙයි.

### viii. චීවරඛන්ධක

චීවර පිළිබඳ භික්ෂු පිළිපැදිය යුතු ආකාරය පිළිබඳ මෙහි තොරතුරු ඇතුළත් වෙයි. ප්‍රථමයෙන් ජීවක වෛද්‍යවරයාගේ ජීවිත පුවත්, සිවුරු කැපීම, පඩු ගැසීම්, මැසීම්, පිළිබඳ තොරතුරු ඇතුළත් වෙයි.

### ix. චම්පෙය්‍යඛන්ධක

සංඝයාගේ අනුමැතිය පිළිබඳ විස්තර අන්තර්ගත වෙයි. තජ්ජනීය කර්ම, නිස්සය කර්ම, පබ්බාජනීය කර්ම හා පටිසාරානීය කර්ම පිළිබඳ විස්තර ඇතුළත් වෙයි.

### x. කොසම්බඛන්ධක

බුදු රදුන් දිවිමන් යුගයේ දී ඇති වූ සංඝයාගේ භේදයන් පිළිබඳ විස්තර අන්තර්ගත වෙයි. සංඝභේදය පිළිබඳ තොරතුරු හා දීඝායු කුමාර පුවත බුදුරදුන් පාරිලෙය්‍යක වනයට වැඩමවීම ආදී තොරතුරු අන්තර්ගත වෙයි.

මහාවග්ගපාළිය තුළ අන්තර්ගත ඛන්ධක දහය තුළින් සංඝ සංස්ථාවේ ක්‍රියාකාරිත්වය සඳහා බලපානු තොරතුරු රැසක් සංග්‍රහ කොට තිබේ.

## චුල්ලවග්ගපාළි

විනය පිටකයෙහි සිවු වන කෘතිය චුල්ලවග්ගපාළියයි. චුල්ලවග්ගයේ ග්‍රන්ථ සැකැස්ම සිදු කොට තිබෙන්නේ 'ඛන්ධක' නම් වර්ගීකරණ මතයි. මෙම කෘතියේ පශ්චාත්කාලීන සංවර්ධනීය ලක්‍ෂණ දක්නට ලැබේ. මෙහි අවසාන වග්ග වන පඤ්චසතිකඛන්ධකය හා සත්තසතිකඛන්ධකය තුළ පිළිවෙලින් ප්‍රථම හා ද්විතීය සංගායනා පිළිබඳ තොරතුරු ඇතුළත් වෙයි. එම ඛන්ධක දෙක දෙවැනි සංගායනාවෙන් පසු චුල්ලවග්ගයට එක් වී ඇති බව පෙනෙයි. චුල්ලවග්ගපාලියෙහි අඩංගු ඛන්ධක ගණනින් දොළස කි. එනම්,

i. කම්මක්ඛන්ධක
ii. පාරිවාසිකක්ඛන්ධක
iii. සමුච්චයක්ඛන්ධක
iv. සමථක්ඛන්ධක
v. ඛුද්දකවත්ථුක්ඛන්ධක
vi. සෙනාසනක්ඛන්ධක
vii. සංඝභේදකක්ඛන්ධක
viii. වත්තක්ඛන්ධක

ix. භික්ඛුණික්ඛන්ධක

x. පාතිමොක්ඛඨපනක්ඛන්ධක

xi. පඤ්චසතිකක්ඛන්ධක

xii. සත්තසතිකක්ඛන්ධක

**i. කම්මක්ඛන්ධකය**

කම්මක්ඛන්ධකයෙහි විනය නීති කඩන ලද භික්ෂූන්ට සිදු කරන ලද දඬුවම් පිළිබඳව විස්තර දැක්වේ. එහි දණ්ඩන කර්ම විනය කර්ම ධම්මකම්ම හා අධම්මකම්ම ලෙස දොළොස් ආකාර කර්ම පිළිබඳ විස්තර අන්තර්ගත වෙයි.

**ii. පාරිවාසිකක්ඛන්ධකය**

පාරිවාසික වත් පරිවාස සමාදාන විධි, මූලායපටිකස්සන, මානත්ත, අබ්භාහන පිළිබඳ විස්තර හා ඒවා සමාදාන වන ආකාරය ආදී විස්තර ඇතුළත් වෙයි.

**iii. සමුච්චයක්ඛන්ධකය**

පටිච්ඡන්නාපටිච්ඡන්න සංඝාදිසේස ආපත්ති පිළිබඳ පරිවාස දානය, මානත්ත, අබ්භාහන දානය ආදී විනය කර්මයන් පිළිබඳ විස්තර අන්තර්ගත වෙයි.

**iv. සමථක්ඛන්ධකය**

විවාදාධිකරණ, අනුවාදාධිකරණ, ආපත්තාධිකරණ හා කිච්චාධිකරණ යන සිවු වැදෑරුම් අධිකරණ හා ඒවායේ විසඳන සත්ත අධිකරණ සමථ පිළිබඳ විස්තර අන්තර්ගත වෙයි.

**v. ඛුද්දකවත්ථුක්ඛන්ධකය**

භික්ෂුවගේ දෛනික ජීවිතය හා බැඳි ස්නානය, ආභරණ භාවිතය, කෙස් කැපීම්, මුහුණ සැරසීම, නිච්ච ගීත ආදිය,

ගීයෙන් දහම් දෙසීම් ආදිය පිළිබඳ පැවතිය යුතු ආකාරය දැක්වේ. ඛන්ධ පිරිත ද මෙම ඛන්ධයෙහි ද අන්තර්ගත වෙයි.

**vi. සෙනාසනක්ඛන්ධකය**

විහාර සේනාසන භාවිතය, රජගහනුවර සිටුවරයාගේ ආරාම පූජාව, ආරම පූජාවේ ආනිසංස, භත්තුද්දේසක, සේනාසනපඤ්ඤාපක, භණ්ඩාගාරික, චීවරපටිග්ගාහක, චීවරභාජක, යාගුභාජක, අප්පමත්තවිස්සජ්ජක, පත්තගහාපක, ආරාම පේසක, සාමණේර පේසක, ඛජ්ජභාජක ආදී සංඝ දේපළ පිළිබඳ ඇවතුම් හා පැවතුම් පිළිබඳ විස්තර අන්තර්ගත වෙයි.

**vii. සංඝභේදකක්ඛන්ධකය**

අනුපිය නම් අඹ වනයෙහි වසන සමයෙහි භද්දිය, ආනන්ද, භගු, කිම්බිල, දේවදත්ත යන ශාක්‍ය කුමාරවරු පස්දෙනා ද උපාලි නම් කපුවා පැවිදි කිරීම, දේවදත්ත බුදුරදුන් ඝාතනයට ගත් උත්සාහය, පංචවර යාචනය, සංඝභේදය පිළිබඳව ද මෙහි දී විස්තර අන්තර්ගත වෙයි.

**viii. වත්තක්ඛන්ධකය**

ආගන්තුක, ආවාසික, ගමික, අනුමෝදනා, භත්තග්ග. පිණ්ඩචාරික, ආරඤ්ඤික, සේනාසන, ජන්තාඝර, වච්චකුටි, උපජ්ඣාය, සද්ධිවිහාරික, ආචරිය, අන්තේවාසික යන වත් දාහතර පිළිබඳ මෙහි භික්ෂුව ක්‍රියාත්මක විය යුතු ආකාරය හා ඒවා පැනවීමට හේතු ආදිය අන්තර්ගත වෙයි.

**x. පාතිමොක්ඛඨපනක්ඛන්ධකය**

පූර්වාරාමයේ පෝය කිරීමේ පුවත, සයුරෙහි හා සසුනෙහි ආශ්චර්යමත් සිද්ධි අට, උපෝසථ සිදු කළ යුතු ආකාරය ආදිය පිළිබඳ තොරතුරු අන්තර්ගත වෙයි.

**ix. භික්ඛුණික්ඛන්ධකය**

භික්ඛුණී සාසනය ආරම්භය, භික්ෂුණී උපසම්පදා පිළිබඳ, සවග භික්ෂුණීන්ගේ නොසරුප් කටයුතු පිළිබඳ තොරතුරු මෙහි දැක්වේ. භික්ෂුණීන්ට අදාළ පිළිවෙත් පිළිබඳ බොහෝ ශික්ෂා පද අන්තර්ගත වෙයි.

**xi. පඤ්චසතිකක්ඛන්ධකය**

සම්බුද්ධ පරිනිර්වාණයෙන් අනතුරුව සුභද්‍ර නම් භික්ෂුවක විසින් සිදු කළ අභද්‍ර වචනය, මහා කස්සප තෙරුන්ට ආනාගතයේ දී සාසනය පිළිබඳව ඇති වූ සැකය, පළමු ධර්ම සංගායනා විස්තරය, ආනන්ද තෙරුන්ට එල්ල වූ චෝදනා හා ඒවාට දුන් පිළිතුරු, ඡන්න හිමියන්ට කළ බ්‍රහ්ම දණ්ඩනය, ඛුද්දානුඛුද්දක ශික්ෂාපද විනිශ්චය, ආදී තොරතුරු අන්තර්ගත වෙයි.

**xii. සත්තසතිකක්ඛන්ධකය**

සම්බුද්ධ පරිනිර්වාණයෙන් වර්ෂ සියයක් ගිය තැන දී සිදු කළ දෙවැනි ධර්ම සංගායනාව පිළිබඳව විස්තර, අකැප වස්තුව ව්‍යුපසමනය කිරීම ආදිය පිළිබඳ තොරතුරු අන්තර්ගත වෙයි.

## පරිවාරපාළි

විනය පිටකයෙහි අවසාන ග්‍රන්ථ පරිවාරපාළිය ය. පරිවාර යන්නෙන් ම ප්‍රකාශ වන්නේ විනය ග්‍රන්ථ සඳහා සිදු කළ පරිශිෂ්ටයක් බවයි. සියලු විනය කරුණු ඒකරාශී කරමින් විනය සඳහා සිදු කළ සාරසංක්ෂේපයක් හා සමන ය. සසුනෙහි පැවිදි වූ ආධුනිකයන් සඳහා ප්‍රගුණ කළ හැකි විනය කරුණු

පිළිබඳ තොරතුරු මෙම සංග්‍රහ කොට තිබේ. පරිවාරපාළියෙහි ග්‍රන්ථ සැකැස්ම සිදු කොට තිබේනේ 'වාර' යන පරිච්ඡේදකරණ යටතේය. පරිච්ඡේද 16ක් තුළ විනය ශික්‍ෂා සංග්‍රහ කොට තිබේ. මහාවිභංගය, භික්ඛුණී විභංගය වශයෙන් කොටස් කර ඒ කොටස්වල භික්‍ෂූන්ට හා භික්‍ෂුණීන්ට අදාළ ශික්‍ෂා සංග්‍රහ කොට තිබේ.

i. කත්ථපඤ්ඤත්තිවාර
ii. කතාපත්තිවාර
iii. විපත්තිවාර
iv. සංගහිතවාර
v. සමුට්ඨානවාර
vi. අධිකරණවාර
vii. සමථවාර
viii. සමුච්චයවාර
ix. කත්ථපඤ්ඤත්තිවාර
x. කතාපත්තිවාර
xi විපත්තිවාර
xii. සංගහවාර
xiii. සමුට්ඨානවාර
xiv. අධිකරණවාර
xv. සමථවාර
xvi. සමුච්චයවාර

මෙම පරිච්ඡේදවලින් අනතුරුව ඛන්ධක පුච්ඡා යනුවෙන් කොටසක් සංග්‍රහ කොට තිබේ. පරිවාරපාළිය ලාංකීය භික්‍ෂුවක් සංග්‍රහ කොට තිබෙන බව බොහෝ දෙනෙක් විශ්වාස

කරයි. ඊට හේතුව ග්‍රන්ථාවසානයේ දක්වා තිබෙන ගාථාවයි. එනම්,

" පුබ්බාචරියමග්ගං ච පුච්ඡිත්වා තහිං තහිං
දීපනාමො මහාපඤ්ඤො සුතධාරී විචක්ඛණො
ඉමං විත්ථාරසංඛෙපං සජ්ඣාමග්ගෙන මජ්ඣිමෙ
චින්තයිත්වා ලිඛාපෙසි සිස්සකානං සුඛාවහං "[20]

මෙයින් ප්‍රකාශ වන්නේ මහා ප්‍රඥා ඇති සුතධාරී වූ විචක්ෂණශීලී වූ දීප නම් ස්ථවිරයන් වහන්සේ විසින් පූර්වාචාරීන් ගමන් කළ මාර්ගය ද බලා ඉගෙනගන්නා වූ අන්තේවාසිකයන්ට සුඛය ඇති කරන්නා වූ මැදිහත් වූ සිතින් විනය පිළිබඳ විස්තර සංක්ෂේපයෙන් රචනා කළ බවයි. මේ තුළින් පැහැදිලි වන්නේ මෙහි කර්තෘත්වය ඇති කෘතියක් බවයි. එනම් බුද්ධභාෂිතයක් ම නොවන බවයි. ලක්දිව හෝ වෙනයම් දේශයක හෝ රචකයෙක් විසින් රචනා කළ කෘතියක් සේ පරිවාරපාළිය සඳහන් කිරීමට පුළුවනි. එසේ වුවද මෙහි අන්තර්ගත වන්නේ බුද්ධ භාෂිත විනය ම බව ශික්ෂාය.

## ආන්තික සටහන්

[1] සමන්තපාසාදිකා i කොටස, හේවාවිතාරණ මුද්‍රණ, 2014, 08 පිටුව.

[2] - එම -, 12 පිටුව. යථාපරාධ යථානුලොම යථාධම්මසාසනානි, සංවරාසංවරදිට්ඨි විනිවෙඨන නාමරූප පරිච්ඡෙදකථාති ච වුච්චන්ති. එත්ථහි විනයපිටකං.

[3] සුභූති හිමි වස්කඩුවේ, අභිධානප්පදීපිකාසූචි, - රාජකීය මුද්‍රණාලය, කොළඹ, 1893, 205 පිටුව.

[4] සමන්තපාසාදිකා i කොටස, හේවාවිතාරණ මුද්‍රණ 2014. 10 පිටුව.

[5] පාරාජිකපාළි ii කොටස, බුද්ධ ජයන්ති මුද්‍රණ, 21 පිටුව.

6 - එම -, 22 පිටුව. න තාව සාරිපුත්ත ඉධෙකච්චෙ ආසවට්ඨානීයා ධම්මා සංඝෙ පාතුභවන්ති. අථ සත්ථා සාවකානං සික්ඛාපදං පඤ්ඤාපෙති. උද්දිස්සති පාතිමොක්ඛං. තෙසඤ්ඤෙව ආසවට්ඨානීයානං ධම්මානං පටිඝාතාය.

7 - එම -, 48 පිටුව. තෙනහි භික්ඛවේ භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤාපෙමි දස අත්ථවසෙන පටිච්ච සංඝසුට්ඨුතාය සංඝඵාසුතාය දුම්මංකූනං පුග්ගලානං නිග්ගහාය පෙසලානං භික්ඛූනං ඵාසුවිහාරාය දිට්ඨධම්මිකානං ආසවානං සංවරාය සම්පරායිකානං ආසවානං පටිඝාතාය අප්පසන්නානං වා පසාදාය පසන්නානං වා භියොභාවාය සද්ධම්මට්ඨිතියා විනයානුග්ගහාය එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ.

8 මජ්ඣිම නිකාය ii කොටස, කීටාගිරි සුත්ත, බුද්ධ ජයන්ති මුද්‍රණ, 2006, 246-248 පිටු.

9 සමන්තපාසාදිකා i කොටස, හේවාවිතාරණ මුද්‍රණ, 2014. 07 පිටුව.

10 පාරාජිකපාළි, බුද්ධ ජයන්ති මුද්‍රණ, 2006, 14 පිටුව.

11 - එම -, 34 පිටුව. එතස්ස, භගවා, කාලො එතස්ස, සුගත, කාලොයං භගවා සාවකානං සික්ඛාපදං පඤ්ඤපෙය්‍ය උද්දිසෙය්‍ය පාතිමොක්ඛං, යථයිදං බ්‍රහ්මචරියං අද්ධනියං අස්ස චිරට්ඨිතිකන්ති.

12 - එම -, 26 පිටුව. අපි ච, යො දෙය්‍යධම්මො සො න දින්නො. තඤ්ච ඛො නො අසන්තං, නොපි අදාතුකම්‍යතා, තං කුතෙත්ථ ලබ්භා බහුකිච්චා ඝරාවාසා බහුකරණීයා.

13 - එම -, 48 පිටුව.

14 - එම -, 54 පිටුව.

15 - එම -, 56 පිටුව.

16 පාරාජිකාපාළි, 56 පිටුව. භික්ඛූති භික්ඛකොති භික්ඛු, භික්ඛාචරියං අජ්ඣුපගතොති භික්ඛු, භින්නපටධරොති භික්ඛු, සමඤ්ඤාය භික්ඛු, පටිඤ්ඤාය භික්ඛු, එහි භික්ඛූති භික්ඛු, තීහි සරණගමනෙහි උපසම්පන්නොති භික්ඛු, භද්‍රතො භික්ඛු, සාරො භික්ඛු, සෙඛො භික්ඛු, අසෙඛො භික්ඛු, සමග්ගෙන සඞ්ඝෙන ඤත්තිචතුත්ථෙන කම්මෙන අකුප්පෙන ඨානාරහෙන උපසම්පන්නොති භික්ඛු. තත්‍ර ය්වායං භික්ඛු සමග්ගෙන සඞ්ඝෙන ඤත්තිචතුත්ථෙන කම්මෙන අකුප්පෙන ඨානාරහෙන උපසම්පන්නො, අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති.

[17] - එම -, සික්ඛාති තිස්සො සික්ඛා අධිසීලසික්ඛා, අධිචිත්තසික්ඛා, අධිපඤ්ඤාසික්ඛා. තත්‍ර යායං අධිසීලසික්ඛා, අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා සික්ඛාති.

[18] පාචිත්තියපාළි i කොටස, බුද්ධ ජයන්ති මුද්‍රණ, 2005, 04 පිටුව.

[19] එම, 464 පිටුව.

[20] පරිවාරපාළි ii කොටස, බුද්ධ ජයන්ති මුද්‍රණ, 318 පිටුව.